# චීන ගෙදර
# කිරිල්ලිගේ ගීතය

බැසිල් ප්‍රනාන්දු

# කර්තෘගේ වෙනත් පොත්

**A New Era to Emerge ( poems)**
**Kalyana Mitra: Beautiful friendship poems.**

- කොළුවා මළේය කවි
- මානව හිමිකම් ධර්මාලංකාරය (කවි)
- බරණැස් නුවර අබමල් දුටිමි (කවි)
- මානව හිමිකම් පහන
- කාර්යක්ෂමතාව ප්‍රඥාගෝචරභාවය හා ලංකාවේ නීති ක්‍රමය
- ලංකාවේ මානව හිමිකම් ගැටලු සහ ඒවාට විසඳුම්
- දෙල්ගොඩ සමූහ ඝාතනය හා නීතිය නොතැකීම
- ගතානුගතිකත්වයට යටත් නොවී මහහඬින් කථාකරන පක්ෂ දේශපාලනයට ගැතිකම් නොකියන මහජන ව්‍යාපාරයක අවශ්‍යතාවය
- ශ්‍රී ලංකාවේ මානව හිමිකම් 2006 වාර්තාව
- The right to speak loudly – Essays in law and human rights
- Demorlization and hope, a comparative of the ideas of N.F.S. grundtvinh (1783-1872) Denmark and B.R. Ambedkar (1881 – 1956) India on social foundations fdor sustainable democracies.
- Problems Facing the Cambodian Legal System
- POWER vs CONSCIENCE – The Excommunication of Fr. Tissa Balasuriya,
- The Inability of Prosecute: Courts and Human Righrts in Cambnodia and Sri Lanka
- Asian Refugees – A search for Solutions
- Sri Lanka: Militarization vs Modernization, Crime ana Justice, A Critique of the Recomamendations by the Communitee on Reform of the Criminal Justice System in India

An X-Ray ofd the Sri Lankan Policing System-Edited with Syamali Puvimanasinghe

# චීන ගෙදර
# කිරිල්ලිගේ ගීතය

බැසිල් ප්‍රනාන්දු

**චීන ගෙදර**
**කිරිල්ලිගේ ගීතය**

පළමු මුද්‍රණය 2008

© බැසිල් ප්‍රනාන්දු

ISBN : 978-955-1468-00-0

පිට කවරය,
රූ සටහන් හා
සැකසුම : අශෝක පද්මසිරි
(පින්තූර අන්තර්ජාලයෙනි)

මුද්‍රණය : රාවය මුද්‍රණ හා ප්‍රකාශන
අංක 83, පිළියන්දල පාර, මහරගම.

ප්‍රකාශනය : ශ්‍රී ලංකාවේ
වධහිංසාව තුරන්කිරීමේ ජනසංසදය
ආසියානු මානව හිමිකම් කොමිසම

# පිදුම

නැති වූ ලොවක
මෙත් කරුණා පැවතී
ජීවිතයේ අගය මේ යැයි පෙන්වා දී
ගැහැණු පිරිමි වැඩිහිටියනට
මා දෙමාපියන් ඇතුළු
මගේ ගමේ,
කෘතගුණයෙන් පුදමි
මේ කවි.

# යුක්තිය හා සාහිත්‍යය

"යුක්තිය නිර්මාණාත්මක සාහිත්‍යට විෂය විය හැකි තේමාවක්ද" යනුවෙන් යමෙක් ඇසීමට ඉඩ ඇත. එසේ ඇසීමට හේතුව සාහිත්‍යයට විෂය විය හැකි, නොහැකි මොනවාද යන්න ගැන රටේ පැල පදියන්ව ඇති සම්ප්‍රදායන් තුළින් ප්‍රකාශයට පත්වන බමුණු මත තවමත් සමහරුන්ගේ අදහස්වල පදනම ලෙස පවතින නිසාය. රට පරිහානියට ගිය අවධියක සාහිත්‍ය කෘතින්ගේ ආභාෂය, ලංකාවේ ලේඛන කලාවට බලපෑ ආකාරය මාටින් වික්‍රමසිංහ පෙන්වා දුන්නේ මෙසේය: පෞරාණික සිංහලයන්ගේ කලාත්මක ජයග්‍රහණයයි සැලකිය හැකි කෘතීන් ස්වල්පය අයත්වන්නේ ප්‍රතිමා හා වැව් නිර්මාණය කළ අනුරාධපුර කාලයටය. සම්භාව්‍ය සිංහල සාහිත්‍යය ලෙස හඳුන්වන කෘතින් බිහි වුයේ පරිහානියේ කාලයේදීය. 10 වැනි ශතවර්ෂයෙන් පසු බිහිවු මෙම සාහිත්‍ය වත්මන් ලෝකයේ සාහිත්‍ය පිළිබඳ විචාරය ඉදිරියේදී සැලකිල්ලට ගත නොහැකි ඒවා බවද ඔහු කියා සිටියේය. මෙම කාලයේ ඇති වු පරිහානිය හා අනුකරණය මත පදනම් වු සාහිත්‍ය සම්ප්‍රදාය නිසා තමන්ගේ නියම කලාත්මක ජයග්‍රහණයන් ඇත්තේ ගෘහ නිර්මාණාත්මක ශිල්පයේ හා මුර්තිය ප්‍රතිමා කලාවේ අතීත කලාත්මක නිර්මාණයන් තුළ බව ලාංකිකයින්ට වටහා ගත නොහැකි වු බව ඔහු පෙන්වා දුන්නේය. (මාටින් වික්‍රමසිංහ කෘති එකතුව - 10 වැනි වෙළුම ඉංග්‍රිසි ලිපි 67 වන පිට). මෙම කරුණු ආචාර්යය පරණවිතාණද පෙන්වා දී ඇති බව ඔහු සඳහන් කළේය.

මෙම පරිහානියේ යුගය එනම් 10වන සියවසේ සිට පෘතුගීසින්ගේ පැමිණීම අතර කාලය පිළිබඳ සාකච්ඡාව පොදුජන සාකච්ඡාව තුළට එක්වී ඇත්තේ මඳ වශයෙනි. සමහරවිට ඊට හේතුවම උන්මාදනීය ජාතිවාදයට මෙවැනි පරිහානියක කාලයක උරුමද ලාංකිකයා සතුව පවතින බව පිළිගැනීම අමාරු වීම නිසා විය යුතුය.

මෙම පරිහානියේ කාලය දෙස විවේචනාත්මකව බලන කල ලංකාව පමණක් නොව ඉන්දියාව තුළද පැතිරීගිය මහා පරිමාණ සංස්කෘතික ප්‍රතිවිප්ලවයත් ඉස්මතුව පෙනේ. ඉන්දියාවේ මෙන්ම ලංකාවේද දේශපාලනමය සමාජමය හා සංස්කෘතිකමය පසුබෑමේ ඉතාමත්ම වැදගත් රෝග නිධාන මෙම කාලය තුළ ඇති බැවින්, අනාගතය හැඩගස්වා ගැනීම් සම්බන්ධයෙන් වැදගත් පාඩම් මෙම කාලය ගැන හැදෑරීමෙන් ඉගෙන ගැනීමට ඉඩක් පෑදෙනු ඇත.

බුදු දහමෙන් හා අශෝක යුගය තුළින් ඇති වූ ප්‍රගතිය මත ගොඩනැගුනු සමාජ ක්‍රමය පස්සට තල්ලු කිරීම සඳහා මෙහෙයවනු විශාල බලවේග මගින් මෙම ප්‍රති විප්ලවය මෙහෙයවිණ. ඉන්දියාවේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වෙන කාලයද, ලංකාවේ අනුරාධපුරය යුගය ලෙස හැඳින්වෙන කාලයද බොහෝ දුරට එක සමානය. එම කාලයේදී ඉන්දියානු බ්‍රහ්මණ කුලයද ඊට අනුබද්ධ වූ කොටස් විශාල පසුබෑමකට යටත් විය. සමානාත්මතාවය පිළිබඳ සමාජය තුළ පැතිරී පැවති අදහස් වැඩවසම් සමාජයට අවශ්‍යව තිබූ ශ්‍රමිකයන් හා වහල්ලුන් බොහෝ සෙයින් අඩු කළේය. ඉඩම් පාලනය, කෘෂිකර්මය, මෙන්ම ආගමික වතාවත් මගින් පැතිර තිබූ පූජක බලය ආදී සියල්ලක් තුළ විශාල අර්බුදයක් පැන නැගී තිබුණේය.

මේ සමාජ විපර්යාසය පරාජය කොට පාලක කොටස්වල බලය තර කළ හැකි සමාජමය තත්වයක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය වූ කණ්ඩායම් තුළින් මෙහෙයවුන බුද්ධිමය හරඹය, මහා මාරුතයක් බවට හැරීමට අවශ්‍ය වන සමාජ පදනමක් ඇති වී තිබුණේය. එම පසුබිමෙහි ආගමික ස්වරූපයකින් පැණ නැගුන ප්‍රතිවිප්ලවය ඉන්දියාව තුළින් බුදුදහම මුළුමනින්ම මෙන් නැතිකර දැමීමට සමත්විය. විවිධ බ්‍රහ්මණ අදහස්වලින් පෝෂණය වූ දේවධර්මයන්, දේව වන්දනාවට සුදුසු සංගීතය හා භක්ති ගීතද ඇති විය. යම් අදහස් නැවත නැවත පුනරුච්චාරණය කිරීම අරමුණු කොට විවිධ මන්ත්‍ර පතුරුවා හරන ලදි. කල්පනාවට තිබූ තැන නැතිවිය. භක්තිය හා පුණරුච්චාරණය පැතිර ගියේය. ඉන්දියාවේ බොහෝ ප්‍රදේශ තුළ පැතිර තිබූ බෞද්ධ පන්සල් හා විශ්ව විද්‍යාල බ්‍රහ්මණයන්ගේ පූජනීය ස්ථාන බවට පත්විය.

ලංකාව තුළින් බුදුදහම නැතිකළ නොහැකි වූ නමුත්, බෞද්ධ බාහිර පෙනුමක් හා බමුණු අන්තර්ගතයක් එක්තැන් කිරීමට මෙම

ප්‍රතිඵලවලට හැකිවිය. දැඩි පාලනයට මිනිසුන් යටපත් කළ හැකි මානසික තත්වයන් නිර්මාණය කිරිමට තරම් ශක්තිමත් බලවේගයක් ලංකාව තුළ ක්‍රියාත්මක විය. පන්සල හා කෝවිල එකම තැනක පිහිටුවිය හැකි තත්වයන් කරා ලංකාව ක්‍රමයෙන් පසු බැවේය. පරිහානියේ යුගයක් යනුවෙන් ඉහතින් කියවුණේ මෙයයි.

මෙම පරිහානියේ කාලය තුළදී මර්දනයට මිස යුක්තියට තැනක් තිබුණේ නැත. පුනරුච්චාරණයට මිස බුද්ධියට තැනක් තිබුණේ නැත. නිදහස අගය කිරීමක් තිබුණේ නැත. යටහත් පහත්භාවය, නිවටභාවය, අඩුවට ජීවත්වීමේ පුරුද්ද හා පුරුෂාධිපත්‍ය පොදුජන සිත තුළ කා වද්දන ලදි. අභ්‍යන්තරගත කරන ලදි. අද දක්වා ලාංකීය මනස තුළ වැඩිවශයෙන් පවතින්නේ මෙම අභ්‍යන්තර ගතිගුණය. මෙම මානසික තත්වය තුළ ඇති වූ සාහිත්‍ය තුළ යුක්තියට කිසිද තැනක් නැති බව තේරුම් ගැනීමද අමාරු නැත.

එහෙත්, මානව සමාජයේ අගය රැඳී පවතින්නේ යුක්තියට ඇති තැන මතය. මානව හිතවාදය හා යුක්තිය අතර ඇති සම්බන්ධය විශ්ව සාහිත්‍ය පුරාම පැතිර පවතී. යුක්තිය පිළිබඳ අදහස් තුළින් පෝෂණය වන සාහිත්‍ය හා කලාව මානව වර්ගයාගේ උපරිම ජයග්‍රහණයෝය. පරිහානි කාලයේ බැම්මෙන් ලාංකිය සාහිත්‍ය බිඳුණ විට නව ජන කලාවක් බිහිවනු ඇත. බුද්ධියේ ආලෝකයත්, උතුම් භාවමය විඥානයකුත් ඇතිවීම තුළින් රට පුරා මුල් බැස ගෙන ඇති කුහකකම හා ඒ තුළින් පැන නගින ප්‍රචණ්ඩත්වය නැති වී යාමට නම්, යුක්තිය හිමිතැන සමාජය තුළ මුල් බැසගත හැකි තත්වයන් නිර්මාණය කළ යුතුය.

අයුක්තිය තේමාව කොට කවි ලියූ ලේඛකයන් ගණනාවක් ඇත. විමලරත්න කුමාරගම ඔහුගේ සමහර කවි මගින් ගැමියන්ගේ දුකත්, අසරණකමත්, ඔවුන් මුහුණ දෙන අසාධාරණයන් ගැනත් ලිවීය. 'ආරච්චිරාල' එවැනි එක් කවියකි. ටිබට් ජාතික ඇස්. මහින්ද හිමි, ඉතා නිර්දය ලෙස කුහකකම හා අසාධාරණය හෙළා දකිමින් 'කාමුක, කුහක ලොකු අයගේ නරකකමින්' දුක් විඳින ගැමියන් ගැන ලිව්වේය. ජී.ඇස්. පෙරේරා ද මේ තේමාව යටතේ ලියූ තවත් අයෙකි. සිරි ගුණසිංහ ඔහුගේ එක් කවියක ආගම් නාමයෙන් කරන කුහකකම 'කුහකකමේ මහා ගන්ධස්කාරය' ලෙස හැඳින්වූවේය.

විසිවන සියවසේ අගභාගයෙන් පසු මේ දක්වා කාලය ලංකාවේ ඉතාමත්ම කෲර හා කුහක කාලයක් ලෙස හැඳින්විය හැක. මේ කාලය ගැන යථාර්ථවාදීව බලන කාට වුවත් යුක්තිය පිළිබඳව නොලියා සිටීමට බැරිය.

**බැසිල් ප්‍රනාන්දු**
හොංකොංහිදීය
basilfwp@ahrchk.org
www.basilfernando.net

# පටුන

චීන ගෙදර කිරිල්ලිගේ ගීතය
ගෙයක් සාදා ගැනීම
ජීවිතයේ පතුල අලංකාරයි
සමාජයේ පතුල
අලංකාර කළ සොහොන් කොත්
වෙදකම
චිචිරි චිරි චිචිර චිරි කඳුළු ගඟ ගලනවා
ඩොනමෝර්ට වැරදුණා ද
දුගඳ - දේශපාලන මේසය
හෙට නමැති දේශය
යුක්තිය නැති තැන
ඇත්ත සහ බොරුව
අගවිනිසුරුගේ බණ
සොයිසලා හා අම්මලා
සාම ලේකම් කාර්යාලය
මහ හිනාව
ඥානය හා දේශය
තවුසගේ අමුඩය
මකබෑවිලා ගිය උන්ද අපි
නීතිය නිවාඩුවේ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
රෝහිතගේ කකුල කැඩීම ගැන ජනාධිපතිට විවෘත
ලිපියක්
ජෙරාඩ් පෙරේරා ඝාතන සිද්ධිය
අයියෝ රටට ගිය කල

අල බතල කන සත්තුවත් නොකරන වැඩ
ඡන්දය
රජයේ පචෝරිස්
ආයෙමත් සමන්මල් පිපේවී
මා ගැන
අංශභාග රෝගියෝ
තව ඇහැරුණු බවක් නෑ
ඝාතක රජ වංශය
ලුහි ලුහියේ නඩු ඇසීම
උසාවියේ කඩිසරකම හා හොඳහිත
නීතිපති හා නීතිය
පොලිස් පරීක්ෂණ
දූෂණ හා භීෂණ
කුල දහම හා මානව දහම
ස්ත්‍රී අභියෝගය
පැමිණිලි කළ යුතු හැටි
හිමිකම් කඩකිරීම් ලියා තැබීම
අතුරුදහන්වූවන් පිළිබඳව
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ ව්‍යාජභාවය
භාෂණ නිදහස
බැරි බැරි ගාතේ
සම්බුකර් - අඩු කුලයේ තාපසයා
නොපැකිල කරමි එම පව



# චීන ගෙදර කිරිල්ලිගේ ගීතය

සැමදා උදේ පාන්දර හතර වනවිට
චීන ගෙදර කිරිල්ලී අරඹයි ඇගේ සංවාදය
වහා එක්වේ සියගණන් කුරුළු කිරිලියෝ
දිගු කථාබස් ඉන්පසුව පැය දෙකක් පමණ



හිතුවා මමත් දවසක්
මෙයට එක්වීමට
'නැති වූ කැලයක් ගැන ද මේ
කතාබහ'', ඇසුවෙමි මම

''උඹ දන්න දෙයක් නෑ''
කීවා චීන ගෙදර කිරිල්ලී
''අපි ඉන්න නගරයේ ගීයයි අපි කියන්නේ
යටගියාවේ නොව සංක්‍රමණයේ සංවාදය
මේ අප කියන්නේ
පසුතැවිලි කතාවක් නොව,
සතුටු සාමිචියක්'' කියා එම කිරිල්ලී
නැලවිලි හඬින් කී ගීයට
සියගණන් සියොතුන්
එක්විය නැවතත්



## ගෙයක් සාදා ගැනීම

සිහිනයක් දැක්කා වාගෙයි
අක්කා රට ගිහිල්ලා

තාත්තා දුන්න තැන ගෙයක් හදපන්
කියලා ලියුමක් එක්කලා
ලක්ෂ දෙකක් එව්වා
තාත්තගේ හීනේ, උන්දෑ මළ පසුවත්
ඉටුවෙනවා දැකලා
හිතේ මලක් පිපුණා

ඉක්මණට ගිහිල්ලා
මොරටුව පැත්තේ බලලා
ලක්ෂ දෙකක් ගෙවලා
ලී ලොරියක් අරන්
අපේ ගෙදරට ගෙනල්ලා
හොඳට වටකරලා
අක්කට ලියලා කිව්වා
හරිම සංතෝසෙන්

පසුවදා වැඩට ගිහිල්ලා
ආවහම ගෙදරට
අනේ, ඊයේ ගෙනාපු ලී ටික
තිබ්බේ නෑ එතන
හිතන්නත් බෑ එහෙම, එච්චර ලී ගොඩක්
කොහොම ගෙනිච්චද කියලා
සාක්කුවට දාගෙන යන්න බෑනේ

පොලිසියට ගිහිල්ලා
රාළහාමිලාට පින්සිඩු වුණාට පස්සේ
ලියා ගත්තේ නැති හින්දා
යටින් යමක් දීලා
තව දෙනවා කියලා
සිද්ධිය හොඳට කියලා
කොහොම හරි ලියව ගත්තා

ඒ වුණත් කවුරුවත් නෑ බලන්න ආවේ

එන්න කියලා නිතර නිතර ගිහිල්ලා කිව්වාට
දන්න කෙනෙකුට කියලා
ඉහළ නිලධාරීන්ට දන්වා
පෙත්සමකුත් ඇරලත්
ආවේ නෑ කවුරුත්

ඊට පස්සේ පණිවුඩ එන්න ගත්තා
''පැමිණිල්ල අයින්කර නොගත්තොත්
හෙට අනිද්දා ඔයිට වැඩිය
ලොකු දෙයක් වෙන්න පුළුවන්

බලාගෙන ඉඳින් උඹ'' කියලා
පොලිසියේ ලොක්කන්ට හා
නැවත නැවත මං කතරගම දෙවියන්ට
මගේ කතන්දරේ කීවා

මේවා දැනගන්න ලැබිලා
අයියා කොළඹ සිට ඇවිල්ලා
අක්කා කිව්වාය කියලා
ඒකට කමක් නෑ,
දුප්පත් අපට ඔහොමයි
උඹ කරදරේ නොවැටී
හිටියොත් ඇති කියලා
කන්නලව් කරලා මට කියා සිටියා

අයියා මට බල කරලා
ගමෙනුත් අයින් කරලා
වෙන තැනකට ගෙනියලා
රස්සාවකුත් හොයා දීලා
තාත්තා මතක් කරලා
ජීවත් වෙන්න ඕනෑ කියලා
ගමට යන්න එපා කියලා
මා ගැන අක්කට ලියා යැව්වා



## ජීවිතයේ පතුල අලංකාරයි

ජීවිතයේ පතුල ඉතා අලංකාරයි
ආලෝකයෙන් පිරිලා
සිතුවම්කරුවන් මවන සිතුවම්
ජීවිත පතුලේ ඇති මහා ලස්සන
ටිකක් හෙළිකරනවා

ජීවිතයේ පතුලේ මහා කරුණා මහිමේ
ජලකඳක් සේ ගලනවා
මානව හිතවත්කමේ හුස්මත්
බලවත්ව එහි තිබෙනවා
එකිනෙකා එකමුතු කරනා බලයත්
එහි තිබෙනවා

ජීවිතයේ මහ සයුර තුළ
ඇති මේ ජීවිත පතුල
හදවත් තුළයි ඇත්තේ
පතුල දුටු ඇත්තෝ
කල්‍යාණ මිතුරන් වෙනවා
පතුල ළඟාවීමට
බාධක ලෙස දමා ඇති
මඩ පවුරු ඉවත් කර
පාදා ගත යුතුය පිරිසිදු දිය

මුලින් ඇති මඩ පවුර
හද අවුල් කරන මහා භීතියයි
හැලුණු ලේ ගංගා
ඇත සිතුළට රිංගා
සෑම පැත්තකම දැන්
භීතියෙන් කළුවෙලා
මේ මහා මඩ පවුර උතුරනවා
ඉවතට දමන තුරු මෙය
දැකිය නොහැකිය ජීවිත පතුල

බියේ මඩපවුර යට
කුහක කමේ මහ ගන්ධස්කාරයෙන්
පිරුණු මහා මඩ වගුර
පිරී ඉතිරී තිබෙනවා
ආගම් නමින් බොරු කරන්නෝ
දේශපාලන බොරු කරන්නෝ

හමුදා සපත්තුව ගැනත් බොරු කරන්නෝ
නීතියේ නාමයෙන් අයුක්තිය රජ කරන්නෝ
තැනූ මඩ පවුර මෙය
දැරිය නොහැකිය මෙහි ගන්ධස්කාරය
ජීවිත පතුල දැකීමට නම්
ඉවත් කළ යුතුයි මේ කුහකකමේ මඩ පවුර

කිරි මුහුද කලත්තලා
නොමියෙන ඖෂධ ගත්තාසේ
ජීවිතේ පතුල කළඹවා
එහි ඇති අලංකාරය
මතුකර ගැනීමට ඇත්තේ
පොදු ජන බුද්ධිය නමැති
මහා පර්වතය කරකවා පමණයි
බොරු විඥානයෙන්
පඬිවරුන් සාදා තිබෙන
බිය හා කුහකකම් මඬවගුරු
ඉවත් කළ හැකි
පොදු ජන ප්‍රඥා පර්වතය
නැවත ඔසවා ගත යුතුය
ඉක්මණට
මඩ පවුරු ඉවතලා
ළඟාවිය හැකි එවිට
ජීවිත පතුලට

දස සිය වසක ශාපය
තුළින් යටවත් වූ පොදුජන
ප්‍රඥා ගුණය
අප කරා නැවත ගෙන එන
ශ්‍රමිකයන් දැන් ඕනෑ වී ඇත
ජීවිත පතුලේ ආලෝකය
දැක ගන්නට නම් අපි
නුදුරු දවසක

## සමාජයේ පතුල

වෙන් වෙන්ව ජීවත් වෙන මැරෙන අපි
වෙමුය එකිනෙකාගේ කොටස්
මගේ ජීවිත පතුල
හා
ඔබේ ජීවිත පතුල
බැඳී ඇත, සමාජ පතුලේ

පොළොව හා ගස් මුල් සේය
ජීවිතයේ පතුල
සාමූහික මිනිස්කම අමතක කොට
බැරිය
සොයා ගන්නට ජීවිත පතුල

කැත නම් සමාජය
මගේ මූණ ද කැතවේ
කැඩපත ඉදිරියේ
කුහකකමේ මහා ගන්ධස්කාරය
ඇත්නම් මා නිජබිම

මා ළඟ ද ඒ දුගඳ
තිබෙනවා විය යුතුය

ජීවිතයේ පතුල
හා
සමාජයේ පතුල
ඇත්තේ එකට බද්ධව
දුකේදීත් සැපේදීත්
හොඳේදීත් නරකේදීත්



## අලංකාර කළ සොහොන් කොත්

මිනීමැරුමකින් පසු
සොහොන තුළ නිදන්නේ
ඔබමය, මිනීමරුව

මළගිය ඇත්තෝ
නොනිදති සොහොන්වල
ඔබේ නිවහන
අලංකාර කළ සොහොනකි

මරණයක් මරණයක් පාසා
අපේ සිරුරු වෙයි සොහොන් කොත්
සාමූහික මරණයක
මල්වඩමක් වැන්න අපේ සිනා මුහුණු



## වෙදකම

කට්ටඩියකු ඕනෑ තැන
පණ්ඩිතයකු කුමකටද
රෝගී වූ සිතට
සුවය ගෙන ඒමට
බැරිය පණ්ඩිතයන්ට

විකාර වූ ජනමනස
තවත් මඩකරන පඬියා
ඉවත් කොට සබයෙන්

මනස සනසා, නලවා
ඇතුලේ ඇති අඳුර මකා
සහනශීලී ආලෝකය
ළඟාකර දිය හැකි
වෙදෙකුයි දැන් ඕනෑ, රටට

## චිචිරි චිරි චිචිර චිරි කඳුළු ගඟ ගලනවා

චිචිරි චිරි චිචිර චිරි
කඳුළු ගඟ ගලනවා
චිචිර චිරි චිචිරි චිරි
අපි සැවොම අඬනවා
අනුරපුර දා සහයෝගය
වියට්නාමයේ වාගේ
බුදුදහම මතින්
නැගීගත් යුගයේ

චිචිරි චිරි චිචිරි චිරි
බ්‍රහ්මණ අභියෝගය
පස්සා දොරින් අතුළුව
සිහසුන කරා ළඟාවිය

චිචිරි චිරි චිචිරි චිරි
ජනයා බේද විය
වැදගත් නොවැදගත්, හීන දීන
බෙදී වෙන්විය

චිචිරි චිරි චිචිරි චිරි
එකමුතුව දියව ගිය
චිචිරි චිරි චිචිරි චිරි
මුළු රටක් මුලාවිය



## ඩොනමෝර්ට වැරදුණා ද

සිටියා නේද උඹ
ජේසුත් එක්ක
'අනේ නෑ, මම නොවේ
උන්දෑ දන්නෙත් හඳුනන්නෙත් නැහැ'
කිව්වා පේදුරු
හැඬුවා කුකුළා, එවිට
'කුකුළා හඬලන්නට පෙර
උඹ පාවාදෙනවා මා, තුන්වරක්'
මතක් විය පේදුරුට

'ඊයේ මැතිතුමා
ඒ පැත්තේ නේද?'
'අයියෝ නෑ, ඒ මම නොවේ
වෙන කවුද, ඔහේට වැරදීමක්'

ඩොනමෝර්ට වැරදුණා ද
කවුරු කාට පැරදුණා ද
කටේ වාචාල කම හැර
බුද්ධියක් ඕනෑද මැතිසබේට



## දුගඳ - දේශපාලන මේසය

පඩ හඩය පඩ ගඳය
දේශපාලන මේසයේ
බඩජාරීන් වමාරති
වේදිකා කාණුවේ
මහා මැසි උවදුරකි
ඒ කුඩා දේශයේ

## හෙට නමැති දේශය

ඊයේ ගඟ නොව හෙට
නව ගඟකි ගලනුයේ
ඊයේ දේශය නොව හෙට
නව දේශයකි තිබෙනුයේ

ගෙවීගිය ඊයේ දින සිහිනයෙන්
දේශය මිදෙනුයේ
හෙට දිනය උදාවෙනි
ජීවිතය එළ දරනුයේ

හෙට දිනය දැක ගන්ට
වරම් අප ලබනුයේ
අද දිනය බින්ද විට බැම්ම
යල් පැනපු සිහිනයේ



# යුක්තිය නැති තැන

යුක්තිය නොමැති කාලෙට
මුකුත් නෑ වැදගත් දෙයක්
සත්‍යය පිපෙන්නේ යුක්තියේ අතුවලයි
එකමුතුකමත් එහෙමම
තමයි උපදින්නේ

අයුක්තිය ඇති විටක
බිය පමණයි තියෙන්නේ
සෑම වැලි ඇටයකම
බිය, සැකය, නිවටකම පැතිරී
ජනයා හිවල් රැලක් වාගේ වෙනවා

## ඇත්ත සහ බොරුව

පිස්සන් කොටුවේ නෑ ඇත්තයි නැත්තයි කියා දෙකක්
පාලක මහත්වරු කියනවා මෙහෙම
'ඔබට ඇත්තේ සුළු ලෙඩක්
කැලේ ඇතින්නියකට
අලියකුගේ ලිංගයක්
සුළුදෙයක් වෙන්න ඕනෑ

'ඔබේ අඹුවත් හොඳින් ඉන්නවා
ඔබ ගැන හිතන එකමයි කරන්නේ
ඔබේ දරුවන් හොඳින් පාසල් යනවා
සෙල්ලම් කරනවා
හෙට අනිද්දා හොඳ වෙලා යා හැකි ගෙදර'

'පස්සෙ කාලෙ ගැන වැඩක් නෑ හිතලා
අදට දෙන බේත බීවම
හොඳට නින්ද යනවා
හෙටක් ගැන හිතල කුමටද ලතවෙන්නේ
දෙවිවරු වගේ අපි
කාලය කියන විකාරයෙන්
පිස්සන් කොටුව විමුක්තිය ලබලා



## අගවිනිසුරුගේ බණ

මහ රෑ අගවිනිසුරු දොඩයි
බණ
මහ දවාලේ බෝම්බ පුපුරයි
අගනුවර

නීතිය නැත රටේ
මසුරන් වචන ඇත කටේ

ගොන් හරක් මූසලයන්
කියා බැණ ගනිති මැති සබේ

මහ රෑ අගවිනිසුරු දොඩයි
බණ
පිහිටක් නැතිව වැළපෙයි
සියළු දන

## සොයිසලා හා අම්මලා

වලස්සු ඇවිල්ලා
ඉක්මණට අරන් එනවා කියලා
අම්මට කියලා
රිචඩ් සොයිසා
අතින් ලෝකෙට ගෙනිච්චා

සොයිසගේ අම්මා
යාළුවන් මග හරිනු දැකලා
රට ගැනමත් කලකිරිලා
තනිවෙලා ලතවෙලා
යන්නට ගියා එලොවට මෙහෙ එපාවෙලා

ඒ වගේ සොයිසලා
හැම හැම අරන් යන
වලස්සු බෝවුණා රටේ
කොයි පැත්තත්, කොයි වෙලාවෙත්
රිචඩ්ලා, එයාගේ අම්මලා

අවුරුදු ගෙවී දශක බවට පත්වෙනවා
තවමත් කොල්ලෝ නැතිවෙනවා
අම්මලත් රටේ දරුණුකම දැකලා
එපාවෙලා මැරිලා යනවා
යළි උපදින්න නෑ ආශාවක්

අම්මලාට එපා වුණු රට
කොහොමද හොඳ තැනක් වෙන්නේ
කොටි වලස් මහ වනයක්
මර මරා ඉවරයක් නැති
මහ සත්තු වත්තක්

## සාම ලේකම් කාර්යාලය

සාම කාර්යාලයේ ලොකු උන්නැහේ
බල්ලා එක්කත් තරහ වෙලා
උෟට ලේ පුස්ම දැනිලා
කලකිරීමෙන් වාගේ
බිම බුදියනවා බලන් ඉන්න බැරිව

උන්නැහේගේ අම්මටත් බැනලා
'අනේ බං, අර බලපං
එහා පැත්තේ පාරේ
කොල්ලෙක් මරා දාලා
අනේ පව්' කිව්වා කියලා
'මරන්න ඕනෑ
ඒවා තේරෙන්නේ මොළේ ඇති අපටයි
කෙරවළක් නැතිව මරපුවහම
ප්‍රශ්නේ විසඳෙනවා
තේරුම් ගන්න බැරිනම්
කට වහගෙන හිටපල්ලා'

කොම්පියුටරය ළඟ වාඩි වී
ලෝකෙට මෙහෙම පණිවුඩයක්
හේ තෙමේ ලියනවා
රට සාමකාමිය, කිසි සැලකිය යුතු වෙනසක් නෑ
ඉතාමත් යහපත් තත්ත්වයක් තියෙනවා

ශබ්දකෝෂය පෙරළා
හොඳ හොඳ වචන හොයලා
අලංකාර කරලා
සාමයේ ගුණ ගයා
තව තවත් ලියනවා

# මහ හිනාව

මහන්තත්තේ අහසට උසයි
ඊරිසියාව මුල් බැහැලා
මහා වෛරෙන් බලන්නේ
දුප්පත් ගෙදර කොල්ලා
ඉගෙන ගන්න දරන වෑයම

ඒ නීච මූසලයෝ
ලොක්කෝ වෙන්නද බලන්නේ
අපේ උන් සොක්කෝ වේවිද
බෑ මේවා බලාගෙන
ඉවසලා ඉන්න බෑ

'පොලීසියේ ලොක්කෝ
බලපන් මේක
අල්ලපු ගෙදර කොල්ලා
අපේ කෙල්ලට  ඔච්චන් කරනවා
උගන්නපන් උන්ට පාඩමක්'

කොල්ලා අල්ලන් ඇවිල්ලා
බාල්කෙක එල්ලලා
අතින් පයින් පොල්ලෙන් තලලා
සිහි නැති වෙනකම්ම
ගැහැව්වා ගූ හුජ්ජ යනකං

මළගෙදර කළු කොඩි
සීයලා අම්මලා වැළපෙනවා
දුප්පත්කම නිසයි මේ කියලා
අල්ලපු ගෙදර මහ මිනිහා
සන්තෝසෙන් හිනා වෙනවා



## ඥානය හා දේශය

කොහොමද දේශය රැකෙන්නේ
මිනිස් ජීවිත වැනසෙන්නට ඉඩ තියලා
ගහක් කොහොමද රැකෙන්නේ
දිය ඉවත්කරලා

එදා දඹදිව වැනසෙද්දී
බමුණු විකාරවලට රැවටී
නැවතත් මිනිස් හදවත් පුබුදුවා
මොළේ අඳුර මකලා
බහුජන දියුණුවට දේශය යටත් කරලා
බුදුහිමි ලබාදුන් ඥානය
අනේ, යටපත් කරලා

මහපොළොව පළී නැහැ
මේ මහා විනාසෙට, විකාරෙට
දේශයේ නාමයෙන් කරන බොරු හින්දා
රට ලෙයින් තෙත්කරන මේ කාලයේ
යටගිය අතීතයේ පැවතුණ
පොදුජන හිතේ ශක්තිය
ආයෙත් දේශයට ඕනෑ

# තවුසාගේ අමුඩය

ගිහිගෙය ගිනි ගෙයක් කියමින්
යන නමුත් තපසට
වැඩිකල් නොගොස් ගිනි තියාගෙන
තම මොළයට
අවුල් කරන්නට බලති
කාගෙත් ඉහමොළ

රැක ගන්නට ගොස් අමුඩය
මල්හාමි පත් වූ අවුලට
වැටෙයි, බොහෝ තවුසන්
එදත් අදත්

දහඩිය හෙළා දිවිරකිනා
තමන්ගේ හා අනුන්ගේ
අහිංසක ගිහියෝ කරන පිං
නොපෙනේ තවුසනට

සාමූහික හැඟීමෙන්
බැඳී ඇතිමුත් අහිංසකයින්ගේ සිත්
තවුස් සිත් තුළ නැත අනුකම්පාව
ගිහි සිතේ උදාවෙන
වැඳ වැඳ ලොක්කන්ට
පල්ලි පන්සල් හැදුවට
බෑ ඒ ගොල්ලන්ට
හොඳ නරක තේරුම් ගන්ට

ඝාතන්ගේ පිටු පස්සේ
කුහරයකැයි අපායෙත්
කුහක තපසන් ලගින්නේ
කියා කීවා මහා කවියෙක්



## මකබෑවිලා ගිය උන්ද අපි

මකබෑවෙලා ගිය උන්ද අපි
නෑ, තවම හුස්ම තියෙනවා
ඒත් මකබෑවෙලා ගිය උන්ට වාගෙයි
අපටත් සලකන්නේ

අප වලපල්ලට දමා නෑ තාම
ඒත් සමාජයේ වලපල්ලට
අප දාලා අප ඉපදෙන්නටත් පෙර
හීන, දීන මලපෙරේතයොලු
අපි

උදේ හවා මරණවා අපේ සිත්
බල්ලෝ වගෙ හිටපියව් කියලා
රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එහෙම තියනවාලු
කියනවා නීතියේ මුර බල්ලෝ
උන් අපට නිතරම බුරනවා

මිහිතලේ බලුකමට තල්ලුවී ඇත්තෝ
බලුකමින් මිදිය යුත්තෝ
අපේ හිත් අපිම පුබුදුවාගෙන
මේ වලපල්ලෙන් නැගිටිනවා මිස
වෙන මගක් නෑ අපට

## නීතිය නිවාඩුවේ

සරුංගලේ නූල කැඩිලා
හුළඟේ යනවා වගේ
ලංකා ජනරජ ව්‍යවස්ථාවේ නූල් හැලිලා
කොළ හුළඟේ පාවෙනවා

'මම යකෝ රජ'
උඹලා ගූ කොල්ලෝ
කවුරු කවුරුත් වලිගේ අකුලාගෙන
ඈත් වෙලා උඩ බලාගෙන ඉඳලා
ඉඳලා හිටලා බුරනවා

නීතිය නිවාඩුවේ
කවුරුත් නීතියෙන් නිදහස් වෙලා
අවුල් වූ පාරක් වගෙයි රට
වැඩි දෙනෙක් මහ පාරේ
'යකෝ අපි රජවරු' ටික දෙනෙක් කියනවා



## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

බල්ලන් කන උණකටුවා වගෙයි
අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ජනතාවගේ ලොං හැලිලා
කෙට්ටු වෙලා
මැස්සන් එලවන එකටම
දවස ගත වී යනවා
විසඳුමක් නෑ මේ දුකට

## රෝහිතගේ කකුල කැඩීම ගැන ජනාධිපතිට විවෘත ලිපියක්

දෙයියෝ නැද්ද පාලකයෝ    මැරිලාද
නීතිය නැද්ද නැත්නම් නිදි    වැදිලාද
පොලීසියෙන් සිදුවන මේ    අපරාධ
වෙන්නට මෙහෙම කවුරුන් ඉඩ    දෙනවාද

රෝහිත නමැති තරුණෙකි කකුලක්    කැඩිලා
යකඩ පොල්ලකින් පොලිසියේ උන්    ගහලා
අවුරුද්දක්ම ඉන්නේ දැන් දිගා    වෙලා
ආණ්ඩුව නොමැත සිදුවන දේ    සොයලා

කකුල කඩපු උන් කාකිය ඇඳ    සිටිති
තාමත් ආණ්ඩුව උන් හට පඩි    ගෙවති
නීතිය රකින්නෝ ලෙස පෙනිලා    සිටිති
මේ ගැන නිහඬ ඇයි පොලිසියෙ    පොලිස්පති

පොලීසියේ ලොක්කෝ සිද්ධිය    දනිති
කිසිවෙක් නොදන්නා සේ උන් දිවි    ගෙවති
අවනීතිය රකිති ජනයෝ දුක්    විඳිති
නීතිය රැකිය යුත්තෝ එය නැති    කරති

ජනපතිතුමනි රෝහිතගේ දුක    බලනු
කඩා වැටුණු නීතිය යළි    ගොඩනගනු
වන්දි ලබා දී ඔහුගේ දිවි    රකිනු
කකුල කැඩූ උන් දඟගෙට    යවාලනු



# ජෙරාඩ් පෙරේරා ඝාතන සිද්ධිය

ජෙරාඩ් නමැති හිතවතෙකුට කළ හදිය
හොඳ හැටි කියන්නට මාගේ කට මදිය
මර්දන හස්තයෙන් ඔහු නැති කළ විදිය
සිහිකර හඬයි කැලණියේ මහ නදිය

උපතින් හැඳල හයියක් ඇති තරුණ රට
බයක් නොමැති හිතවත්කම ඇත සැමට
සිනාවක් මුවේ උපතින් උරුම කොට
පින්වත් තරුණයා අමතක නොවේ මට

මරණ තුනක් වුණ දිනදී වත්තලදී
පොලිසියට අග මැද මුල වැරදී
මොළයක් නැතිව කටයුතු කරනා විටදී
නීතිය මැකී භීතිය මතුවුණ තැනදී

දරුවන් අරන් පාසල් ගිය මව නවතා
සැරකර රියක් ඇතුළට ගෙන බොරු පවසා
දුරකතනයෙන් හිතවත් සැමියා අමතා
යක්ෂ රැලක් ගොදුරක් සොයනා විලසා

ආදර හිතින් කඩිමුඩියේ පැමිණි පියා
මගදී අල්ලාගෙන මේ හොරු අරන් ගියා
බාල්කයක එල්ලා ඇස් වසා තියා
පොල්ලෙන් පහර දුනි තොරතුරු අසා පියා

හසරක් නොදැන කිසි අපරාධයක් ගැන
අසරණ තිදරු පියෙකුට කළ හැටිය වින
දොස්තරවරුන් කඩිමුඩියෝ වැට ලැවුණා
වකුගඩු කඩා වැටිලා යයි නියම වුණා

තත්ත්වය නරක් වී දින දිනම
සිහිසන් නැතිව ඔහු සිටියා සිටි තැනම
නැගිටින එකක් නෑ යන බිය හැම තැනම
අනේ කියා ඇඬුවා මුළු ලක් බිමම

යාළුවො නොමැත ඔහු අතහැර දැමුවේ
බිරිඳත් ළඟම සිටියා පවුරක් විලසේ
දොස්තරවරුන් වෙහෙසුණි රෑ හා දවසේ
එළියක් නැවත ආවා පසළොස් දවසේ

සුවවුණ පසුව කම්පාවී බිය නොවැදී
යුක්තිය සොයන්නට ඔහු දැන් මගට බසී
අධිකරණයේ උදහස පොලිසියට වදී
හිමිකම් කඩකලැයි එහිදී කියන ලදී

වධහිංසාව කර ඇත පෙත්සම් කරුට
දඬුවම දිය යුතුය මේ කළ පොලිසියට
තරවටුවක්වත් කර පොලිසියේ ලොක්කාට
ලිව්වා තින්දුව දිග කොළ ගණනකට

නීතිපතිගේ උපදෙස් පිට අවනඩුව
සොයා බලන්නට පත් කළ දක්ෂ අය
සැකයක් නැතිව දැන හිංසා කරපු අය

දමාලා මාංචුව
මව්තෙට පත් කළා මීගමු උසාවිය

වැරදිකාරයන් අල්ලන පොලිසිය
මෙදා නැංගා විත්ති කූඩුවට
අපරාධ නඩුවකට මූණ දෙන්නට
හත් අවුරුද්දයි නඩුව ඔප්පු වුණෝතින්

අපරාධ කරපු ලොක්කෝ
දැන් බොහොම භයවෙලා
ඔහු පසුපසින් ආවා
නඩුවට නෑවිත් ඉඳලා

අපිව බේරාගනින් සල්ලි දෙන්නන් කියලා
ඒක බාර නොගත් හින්දා
හොඳටම ප්ලෑන් කරලා
යන එනමන් බලලා
කාර් එකකින් පස්සෙන් එලවලා
බස් එකකදි වෙඩි තිබ්බා

එලෙසින් නිහඬ කළ නොහැකිවූ ඔහු හඬට
ලෝකය කිපී නිදි නැති විය ලොකු අයට
පරීක්ෂණේ රට හැම තැන පැතිරී විට
පව් කළ එවුන් හසුවූවා නීතියට

රජකම් කළත් කළකම් එලදෙන බැවිනි
කාකි ඇන්ද මුත් නීතියෙ ගැට ගැසිනි
ජනමතයයි කියා දෙයකුත් ඇති බැවිනි
මිදීමට නොහැක කාටත් කළ පව්නී

නොනැවත නැගුණහොත් හඬ මහ ආවේගෙන්
වධහිංසාව නැති කළ හැක ලංකාවෙන්
ජීවත් වී මොටද බිය මුසු සංකාවෙන්
අපි ඔහු පුදමු හිම්කම් ගැන බලවේගෙන්



## අයියෝ රටට ගිය කල

අයියෝ රටට ගිය කල
　　　රටට ගිය කල
හිතන්නත් හරි කැතැයි
　　　රටට ගිය කල
කියලත් වැඩක් නෑ
　　　රටට ගිය කල
හොයලා වැඩක් නෑ
　　　මේවයේ සුලමුල
වල් ඌරෝ උඩ ඉඳගෙන
　　　රට කෑවා
නිලධාරියෝ උන්පස්සේ
　　　බඩ ගෑවා
පණ්ඩිතයෝ පොත් පෙරළා
　　　බොරු කීවා
කවුරු කවුරු බොරු කීවත්
　　　ජඩ වැඩ මේවා

# අල බතල කන සත්තුවත් නොකරන වැඩ

මිනීමරනවයි කියන එක පයිසෙකටවත්
ගණන් ගන්නැති වැඩක්
මරපියව්, මරපියව්, මරපියව් කියන
පස්සෙන් ඉඳන් උසිගන්නන්නෝ
මුං එක්ක බලපුහම කෙතරම් මහත්මා ගති
ඇත්තෝද කියලා හිතනවා වැද්දෝ

මේ විකාරෙන් අනාගත පරම්පරාව
රැකගන්නවත් විධියක් හිතුවට
මට නම් පේන්නේ නෑ මාවතක්

රට කුඩා වුවත්
මේක ඇතුලේ කෙරී ඇති පව්
මහා විශාලයි
විපාකයක් නෑ පවට

ඒකයි ඔප්පු වෙන්නේ
හිත පපුව දියුණු වී
හොඳ නරක තේරුම් බේරුම්
කරගත් පසුවයි
විපාකය කියා දෙයක් සිදුවන්නේ
එහෙම හිතක් පපුවක්
නෑ මේ භූමියේ කාටවත්
නීචකම තරවෙලා
ජීවිතේ මටසිලුටුකම්
භංග වී ඇති දේශයක්
කුඩා දරුවන් බිහි වී
වලපල්ලට යනවා



# ඡන්දය

තුවක්කු ගෙන කොල්ලෝ එති
ඡන්ද කොළය බෙදලා දෙති
මරණ භය පතුරා ලති
ඡන්ද කොළය ඉල්ලන් යති
ඡන්ද පෙට්ටි උස්සන් යති
දිනුයේ කවුදැයි පවසති
මැරයෝ එති මුර කරන්ට
දිනපු මැතිට පාරේ යන්ට
කෙත්වතු සරු කරන්ට
තවත් බුලට් වපුරවන්ට

# රජයේ පචෝරිස්

රජයේ පචෝරිස් නිලතල
තිබේ ගණනාවක්
ලොකු ලොකු බලතල තියෙනවා
කන්ට බොන්ටත් ලැබෙනවා

දේශපාලන පචෝරිස්
සාම කටයුතු පචෝරිස්
විදේශ කටයුතු පචෝරිස්
පොලිස් අංශයේ පචෝරිස්
කියලා තව පචෝරිස්ලා
ගොඩක් දැන් ඉන්නවා
ටයිකෝට් දාලා
ඉංග්‍රීසි, සිංහල දෙමළ
ඕනෑම භාෂාවක් දන්නවා
මව් කිරි බිව්ව කාලේ
හිටලාම හොඳට පුරුදු වෙලා වගේ

මේ පචෝරිස්ලා හොඳට
රාජකාරිය කරනවා
රටේ ජනයාට ඕනෑ
සියලුම බොරු ලියලා කියලා
කාගේ කාගේත් මොළේ අවුල් කර දානවා

උදේ, දවල් හා රෑ
පචෝරිස්ලා දොඩනවා
යුක්තිය ජයගන්ට
ඉඩක් නැත කියන එක
හිතේ අරටුවට ගෙනියන්න හදනවා



## ආයෙත් සමන්මල් පිපේවි

හීතියේ දේශයේ
පිපෙන්නේ නෑ සමන්මල්

අම්මලා හලන කඳුළින්
තෙත් ව ඇති මිණිමල්
පෝෂණය කරන මේ පොළොව
මව් බිමක් යයි කිව හැකි ද?

සැබෑ පසු තැවිල්ලෙන්
ගත්දාට එම අම්මලාගෙන් සමාව
වේවි මෙය නැවතත් මව්බිමක්
පිපේවි සමන්මල් ආයෙත්



## මා ගැන

පංකාදු මිනිසුන් කට්ටියක්
අසූ නමයේ නරක කාලයේ
වත්තල පැත්තේ
හදාගත් මරණ ලැයිස්තුවට
මරණ ලැයිස්තුවට මගේ නමත් දැම්මා
පීරිස් කියන පොලිස් ලොක්කෙක්
පෙරේරා කියලා මන්ත්‍රීවරයෙක්

නීතිඥ මහත්වරු ටිකදෙනෙක්
තවත් නම නොදන්නා අය
උගුල පස්සේ උන්නා
වැඩේ භාරදුන් එක් නිලධාරියෙක්
හොඳ යාලුවෙක් ලව්වා
මට දැනුම් දුන්නා

මම මෙහෙම හිතුවා
මුං මාව මැරුවොත්

කියයි සමහරු මොකක් හරි කරන්ඩැති එයත්
ඕවා කියන්න කවුද දන්නේ
ත්‍රස්තවාදියෙක් නෙමෙයිනම්
හොරෙක් හරි, ගෑනු ප්‍රශ්නයක් වෙන්ට ඇති
මරණ බයට වැඩියෙන්
අවලාදය හිතට වැදුණා

මං මේ ගැන සිතත්දී
හිත මට හිනාවෙලා කිව්වා
මේ සෙල්ලම පරද්දන්න පුළුවන් කියලා
දැන් දශක දෙකකට කිට්ටුයි
මේ වගේ හිතලා
අනේ, එහෙම නොහිතපු
පාඩුවේ හිටපු අහිංසකයෙක්
විල්බට් වෙද මහතා කියලා
පාරේ ඇදන් ගිහිල්ලා
මරලා දැම්මා

බොරුවේ බොරුව මේ මරණ ගැන
කරලා තිබෙන බොරුවයි
බලයේ බලය වූ මහ ලොක්කෝ
මේ මහ බොරුව උඩ දැන් ඉන්නවා
අතුරුදහන් වුණාය කියනවා
බිල්ලෝ අල්ලං ගියා වගේ

උගුලෙන් බේරුණ නමුත්
මේ වෙච්ච මහ අපරාදේ
හිතේ තව තියෙනවා
වලට යන අම්මලා තාත්තලා
මේ රහස් අරන් යනවා
උන්දැලාගේ හිතේ දුක
සදාකල් සාපයක් කාටත්



## අංශභාග රෝගියෝ

අංශභාග රෝගියෝ වාගෙයි
අපේ දේශපාලනකාරයෝ
මොළේ භාගයක් මැරිලා
පෙනේනනේ එක් පැත්තයි
එක පැත්තක් ඇති දිව
ගොත ගහනවා
එක තැනක හිරවෙලා
ටික ටික මැරී යනවා



## තව ඇහැරුණු බවක් නෑ

සියවස් දහසක් දිග නින්ද
වස කැවිලා වෙන්ට ඇති
මොළේට ගිහින් නිදිමත
බමුණන්ගේ මත
තමයි නිදි බේත
ලෝකයේ ආලෝකය
නෑ මොළයට ළඟාවෙන්නේ
විද්‍යාවේ දියුණුව
නෑ උරා ගන්නේ
බුලත් කෙළ පඬික්කම
ළඟ තියන්
දඬෝරියා වගේ ඔහේ බුදි
හීනයක් දකින්නවත් මොළේ පණ මදි
ඊයේ, අද, හෙට
කියා නෑ වෙනසක්

## ඝාතක රජ වංශය

එකෝමත් එක රටක
එකෝමත් එක කාලයක
තිබුණා රටක්
අයුක්ති දූපත විය එහි නම

ඝාතක නම් වයෝවෘද්ධ
නායකයකු කිරුළ උදුරා ගෙන
වංචාවෙන්
සිහසුනට පත් වූ පසු
බිහිවුණා ඝාතක රජ වංශය
බිය වර්ධන පුරය නම්
අගනුවරක වීය රජ සභය
සීලාචාර ලෝකයේ ඉදිරි ගමන
ඝාතන මගින් කළ යුතුය
යන දහම විය රාජ්‍ය දර්ශනය

මිනී ඔළු නැති තැන
දියුණුවක් නැත යන්න
වීය ඝාතක රජ මතය

යුක්තිය නමැති අදහස
මංමුලාවක් බව ද
අධිකරණ යන්න රටක නොතිබිය යුතු
සංස්ථාවක් යනුවෙන් ද
ශිලා ලේඛනයක් පළ කළා ඝාතක රජු

ඝාතක රජු මළ පසු
ඝාතක දෙක, ඝාතක තුන, හතර, පහ
යනුවෙන් නම් විය රජවරුන්
එම අඳුරු දූපතේ

?

## ලහි ලහියේ නඩු ඇසීම

ලහි ලහියේ නඩු ඇසුවොත් අධිකරණේ
ජනතාවට ලැබෙයි නීතියේ රැකවරණේ
සාක්කියට ගිය විට හිමි තැන මරණේ
අපරාධයට දඬුවම නිසි ලෙස පැමිණේ

## උසාවියේ කඩිසරකම හා හොඳහිත

උසාවියේ කඩිසරකම ඇතිවේවා
උදාසීනකම එතනින් නැතිවේවා
සාධාරණය හා හොඳහිත වැඩිවේවා
යුක්තිය රටේ කොයි කාටත් ඉටුවේවා



## නීතිපති හා නීතිය

අයියෝ! නීතිපති අයියෝ නීතිපති
මැරයෝ ඇවිත් දැරියෝ දූෂණ කරති
මිනී මරති වධහිංසා පමුණුවති
නීතිය නැති රටට කුමටද නීතිපති

## පොලිස් පරීක්ෂණ

සමාජයට හොඳ කළ හැකි පොලීසියක්
වැදගත් වැඩකි වැය කළ යුතු මහන්සියක්
පරීක්ෂණේ වැඩිවූවොත් තියුණු තැනක්
අපරාධයට හිමිවන්නේ අඳුරු ලොවක්



## දූෂණය හා භීෂණය

වැඩි වුණ විටදි රට හැම තැන දූෂණය
ඒකත් සමඟ වැඩිවෙයි මහ භීෂණය
පිටින් පෙනෙන මුත් හීලෑ භාෂණය
ඇත්තට කෙරෙන්නේ හැඩි දැඩි ඝාතනය

## කුල දහම හා මානව දහම

කවුරුත් එකය උපදින්නේ එක ලෙසම
මහ බොරුවක්ය බමුණාන් කී කුල දහම
ඇති හැකියාව මග දියුණුව වෙත යෑම
කාගෙත් අයිතියකි එය මානව දහම

## ස්ත්‍රී අභියෝගය

නැති වෙන්නට කතනයේ ඇති ගොම ගතිය
ස්ත්‍රී අයිතියට නිසි තැන දිය යුතුය
අභියෝගයෙන් ජන පිබිදුම වන විදිය
පෙන්වන්නට ඇති ඉඩකඩ නම් මදිය



## පැමිණිලි කළ යුතු හැටි

යුක්තිය ලැබෙන්නේ පැමිණිලි කළ පසුය
පැමිණිලි යන්න මොනවාදැයි දත යුතුය
වරදක් සිදුවුණේ කොහොමද කිය යුතුය
හැම කරුණක්ම පැහැදිලි කොට දිය යුතුය

කවදද ගැහැව්වේ ඒ කොයි වෙලාවෙද
මොනවද ඇහැව්වේ හා මුළු කතාවද
තව මොනවද වුණේ වෙන අය දුටුවාද
තව තව වෙනත් අතවර හෙම කෙරුවාද

කිව්වා හැම දෙයක් හොඳ හැටි ලිව්වාද
අත්සන දමනු පෙර කියවා බැලුවාද
අඩුවක් ඇතොත් එය කියලා හැදුවාද
බොරුවක් නැතිව ඇත්තම ඔබ කීවාද

## හිම්කම් කඩකිරීම් ලියා තැබීම

යමක් සිදුවුණොත් ඔබ හට අකට යුතු
වහා වෙච්ච දෙය ලියලා තැබිය යුතු
ලියුවොත් සියල්ලන්ටම වන අකට යුතු
හැකියාවක් ලැබෙයි නැසුමට අකට යුතු

දරුණුම වැඩක් ඉතිහාසයේ සිදු වූවා
හිට්ලර් යුදා ජාතිකයන් ගිනි ලෑවා
පීඩිතයන් තමන් දුක කඳුළින් ලීවා
හිම්කම් දහම එම කඳුළින් බිහි වූවා



# අතුරුදහන් වූවන් පිළිබඳව

නමක් නොමැති මේ මල්වඩම
සොහොනක් නොමැති
ඔබටයි

ඔබ පහස ලැබූ පොළොව
සොයාගත නොහැකි වූයෙන්
පාරක් අසල මෙලෙසට
ඔබට සිහිවටන තැබුවාට
කමනු මැනවි, කමනු මැනවි



# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ ව්‍යාජභාවය

මොන කරුමය ද කරනා කිසි වැඩක් නැහැ
ජාතික කොමිසමෙන් සිදුවන දෙයක් නැහැ
හිමිකම් කැඩීමට කිසි පිළිවෙළක් නැහැ
හිමිකම් කඩන්නෝ දැන් කිසි බයක් නැහැ

අඬමින් මිනිසුන් එතනට රැස් වෙනවා
එන සැමදෙනා අඬ අඬ ආපසු යනවා
පගාවටත් හොඳ තැනකුත් පවතිනවා
බොරුවට නම් දරා සමහරු වැජඹෙනවා

## භාෂණ නිදහස

රැස්වී එකට එක්වී අප කියන දෙය
මතයි රැඳෙන්නේ එක් වී කරන දෙය
නිදහසෙ කියන්නට නම් හිතේ ඇති දෙය
මතමයි තියෙන්නේ නිදහස් සමාජය

බාධා කළොත් භාෂණයට සමාජයේ
මුළු ජනතාව ඉන් පස්සේ අගාධයේ
නිහැඬිව නිදන මූසල ජන සමාජයේ
නොදැකිය හැකිය සීමාවක් පරාජයේ

පුවත්පතේ නිදහස අප රැකිය යුතු
පණමෙන් ලියන්නන් ජීවිත රැකිය යුතු
තහනම් නියෝගෙට නම් ඉඩ නොදිය යුතු
ස්වයං තහංචිය නැති කර දැමිය යුතු



## බැරි බැරි ගාතේ

බැරි බැරි ගාතේ ගයනා ගීයකි ඈත
සීතල ගතිය ඇති චූටිගෙ පොඩි දෑතේ
බේතක් ගන්න කිසිවෙකු නැත ළඟ පාත
සිත තුළ නැගෙනවා දුක්බර වුණු ගීත

## සම්බුකර් - අඩු කුලයේ තාපසයා

(මහා භාරතයේ එන කතාවක් ආශ්‍රයෙනි)
වයසක බ්‍රහ්මණයෙක්
මියගිය තරුණ පුතුගේ මිනිය උස්සාගෙන
ආවා රමාගේ මැදුරට
කීවා මෙසේ ඔහු ආවේගෙන්
'ඔබෙ යුතුකම් තිබේ පැහැර හැර
නැත්නම් මැරෙන් නෑ අපේ තරුණ දරුවෝ
අපට පමණක් අයිති තලයට
ඇතුළු වී තිබිය යුතුය පරයෙක්
මේවා වෙන්නේ එවිටයි'

රමා වහා නැග දිව්‍ය වාහනේට
දෙවිවරු දුන් මහා ආයුධය ද රැගෙන
දසත කරකැවුණා
කවුදැයි සොයන්නට මේකා

අනවසරයෙන් බ්‍රාහ්මණ තලයට
ඇතුල් වී ඇති
දකින්නට සිටියේ නෑ එවැන්නෙක්

බමුණන් යෝගී භාවනා කරන
කොහේවත් තැනක
පුරුද්දට අනුව බමුණන්ගේ
ඇසුවා දුටු හැමගෙන්
කුමක්ද ඔබගේ කුටුම්බය කියා

නිවැරදිවම හොරා අල්ලා ගන්නට
පැමිණියා ඔහු සම්බුක වෙත
ගසක වවුලු විලාශයෙන් එල්ලී
යෝගී භාවනාවේ යෙදී සිටි
කුමක්ද ඔබේ කුටුම්භය
ඇසුවා, රමා මහ රජ

'ස්වාමීනි මම, මහා කුටුම්බයක්
උරුම කර නූපන්නෙමි
දැනීමට ඇති ආශාවෙන්
මාගේම උත්සාහයෙන්,
උගත්තෙමි මේ සියළු දෙය
බ්‍රහ්මණ ගුරුවරයෙක් නැත මට'
පිටවෙත්ම මේ වදන් සම්බුකගේ මුවින්
ඇද තමා දරා සිටි මහා අවිය
හෙන ගහන වේගයෙන්
සම්බුක නසාලුවා, වචනයක්වත්
නොඅසා, රමා මහ රජ
කුටුම්බය රැකදීමට
දෙවියෝ ඇවිත් මෙලොවට
මල් මාලා දැම්මලු රමාට
ස්තෝත්‍ර ගී ගයා
කුටුම්බය රැක දීමට කළ වීර ක්‍රියාවට



# නොපැකිල කරමි එම පව

රටේ දුක
කියන එක
පාපයක් නම්
කවියකු නොකළ යුතු
වරක් නොව දහස් වාරයක්
කරමි මම
එම පව
නොපැකිළ